

# ජගත් ජේ එදිරිසිංහ

# පිණි

16

සුමන හාමුදුරුවෝ ගිලන් හලෙන් නික්ම වැලි මිදුලට ආවේ තමා සමග එන්නැයි විශ්වජිත්ට හිසින් සන් කරමින් ය. අණ්ඩ දමා බොහෝ වතාවක් පිළියම් කළා සේ පෙනෙන දුර්වර්ණ සිවුර නිසි ලෙස උර වටා දමා ගනිමින් ඔහු නැවතී විශ්ව දෙස හැරී බැලුවේ ය.

විශ්ව හාමුදුරුවන් අසළින් සිට ගත්තේ ය. මිදුල කෙළවර ඇති ගැල්බැම්මෙන් පහත පෙනන තුරු ලතා අතරින් පහළ තැනි බිමේ ඇති නැවතුම් ශාලාව හා උයන ගෙය යාන්තමින් පෙනෙයි. දුම් නගින්නේ එළිහමනේ තැනූ ලිපකිනි. ඒ මත තැම්බෙමින් තිබෙන්නේ බෙහෙතක් විය යුතු යයි විශ්වට සිතෙයි.

හාමුදුරුවන් බලා සිටින්නේ ඈත අඳුරුවන් කඳු පෙළ දෙස ය. ඒ අන්තයේ අහස පවා අඳුරු ය. වැහි වළාකුලු නිසා විය යුතු ය. තෙත සිහිල් සුළං රැළි ඔවුන් පසුකර හමා ගියේ ය.

"මේක අමාරු වැඩක් විශ්ව.." හාමුදුරුවෝ කල්වේලා ගෙන කීහ.

එය විශ්ව බලාපොරොත්තු නොවූ ප්‍රකාශයක් නොවේ. සියල්ල සුබවාදී ලෙස සිදුවනු ඇතැයි ඔහු කිසිවිටෙක බලාපොරොත්තු වූයේ නැත. යථාර්ථය තුළ දී ප්‍රාතිහාර්යයනට ඉඩක් තිබිය නොහැකි ය. අමන්දි සුව නොවනු ඇතැයි සිතේ කොණක තැන්පත්ව තිබූ හැඟීම සිත මතුපිටට පැමිණීමෙන් උපන් වේදනාව ඔහුට දරා ගත නොහැකි තරම් විය. ඇය පිළිබඳ උපන් විසල් අනුකම්පාවෙන් විශ්ව ගේ සිත හඬා වැටුණේ ය. ඔහු හෙලූ සුසුම හාමුදුරුවන්ට ද ඇසුණි.

"තැනිතලාව දිගේ ඇවිදගෙන කන්දක් පාමුළට ආවාම කඳුමුදුන දිහා බලලා හිත අධෛර්ය කරගන්න එපා.. බිම බලාගෙන අඩියෙන් අඩිය නගින්න.. කවදා කොයි වෙලේ හරි මුදුනට එන්න අපට පුලුවන්.. විශ්ව හිත කලබල කරගන්න එපා... මං කිව්වෙ නැහැනෙ මං වැඩේ බාරගන්නෙ නැතෙයි කියලා.." හාමුදුරුවන් කීවේ එනිසා ය.

".. අපි ප්‍රතිකාර පටන්ගමු.. ඒත් දවසින් දෙකෙන් ප්‍රතිඵල බලාපොරොත්තුවෙන්න එපා.. සමහරවිට මාසයක් නැත්නම් දෙක-ක්වත් ඒ දරුවට මෙහෙ නතරවෙන්න වෙයි.. පල්ලෙහා කාමර කීපයක් තියෙනවා.. කවුරුහරි බවලත් කෙනෙකුටත් තනියට නතරවෙන්න පුලුවන්.." හාමුදුරුවෝ කතාව මො-හොතක නවතා විශ්ව දෙස බැලුවේ ය. ".. ඒ ළමයගෙ හිත හයියයි... ඒක අපට වාසියි.. චිත්ත ඒකාග්‍රතාව හැම දේටම අවශ්‍යයි.. ඒ එක්කම කරන ප්‍රතිකාර පිලිබඳ විශ්වාසය.. ඒකත් අවශ්‍යයි"

වැලි මුදලට බට අමන්දි එහි ඈත සිට කතාවක යෙදී සිටින සුමන හාමුදුරුවන් සහ විශ්ව දුටුවාය. එතනැට යම්දෝ නොයම්දෝ යන දෙගිඩියාවෙන් යුතුව ඈ නැවතී බලා සිටියා ය.

"ඕන්න අපි ලෑස්තියි දරුවො..." තමන්ට ඈතින් නතරවූ අමන්දි දෙස බැලූ සුමන හාමුදුරුවෝ කීහ. ".. කෙරෙන්න ඕනෙ හැම දේම මේ පුතා ලෑස්තිකරදෙයි.. වැඩිහිටියන්ගෙත් ආශිර්වාද අරගෙන මාසයක් දෙකක් හරි නැවතෙන්න අවශ්‍ය කළමනාත් සූදානම් කරගෙන ඉක්මණින් ඇවිත් නවතින එකයි තියෙන්නෙ.. ඉතිරි වගකීම මං බාරගන්නං.."

අමන්දි විශ්ව දෙස බැලුවේ ය. ඔහුගේ දෑසේ රැඳී ඇත්තේ ඉතා සන්සුන් බැල්මකි. ඔහු බැරෑරුම් ලෙස යමක් සිතමින් සිටින්නේ යයි ඇයට සිතෙයි. මේ ගමන ආවේ ඔහු නිසා ය. ප්‍රතිකාර සඳහා සුමන හාමුදුරුවන් වෙතින්



යහපත් ප්‍රතිචාරයක් ලැබෙනු ඇතැයි ගමන පිටත්වන විටදී ඇය නොසිතුවා ය. දහසක් අයහපත් දේ විඳිමින් සිටියදී යහපතක් බලාපොරොත්තු වන්නේ කෙලෙස ද? එහෙත් ජීවිතය පිළිබඳ නැවතත් බලාපොරොත්තු තැබිය හැකි බව විශ්වසනීය හඬකින් සුමන හාමුදුරුවෝ තහවුරු කරති. එය අමන්දිගේ සිතේ ඇති කළේ උතුරා ගලා යන සතුටක් නොවේ. සිත මත විසල් බරක් තැබුවාක් වැනි හැඟීමකි. ජීවිතය අතැර දා පලා යන්නට සූදානම්ව සිට, ඒ වෙනුවෙන් සිත එකලස් කරගෙන සිට, නැවතත් එතුළට පා නගන්නට වීම බරකි. ඒ බර තමාට උසුලා සිටිය හැකි වේද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇගේ සිතේ නොවී ය.

ඈත ක්ෂිතිජයේ යාන්තමින් පෙනෙන කඳු පන්ති අතරින් ක්ෂණික විදුලි රේඛාවක් ගලා යයි. කඳු අතර මහ වැස්සක් වසිනවා විය යුතු ය.

අමන්දි විශ්ව දෙස බැලුවා ය. ඔහු යෝධයකු සේ ළඟින් සිටීම යහපතකි. ශක්තියකි. ඔහු දියේ ගසාගෙන යමින් තිබූ තමාගේ ජීවිතය ඉතා ප්‍රවේශමින් ගොඩට ගත්තා සේ ඉතිරියේදීත් තමා සමගින් ම නොසැළී සිටිනු ඇති බවට ඇති විශ්වාසය අමන්දි ගේ සිතේ ඇති කළේ ශක්තියකි.

කුමක් සිදු වුව ද සියල්ලට කෙසේ හෝ මුහුණ දෙන්නෙමැයි ඇය දැඩිව අධිෂ්ඨාන කළා ය.

0000000000000

"මං මේකට කොහෙත්ම කැමති නෑ..." මිලින්ද සිටියේ කෝපයෙනි. අමන්දි පාරම්පරික වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවන්නට යන්නේය යන ආරංචිය ඔහුගේ සිත දැඩිව කම්පනය කර තිබුණි. ".. මේක හරිම මෝඩ වැඩක්.. කීමොතෙරපි පටන්ගන්නෙ නැතිව පිස්සු වැඩ කරන්න එපා.. අනම් මනම් වැඩ වලට නාස්ති කරන්න කාලයක් ඔයාට නෑ අක්කා.."

අමන්දි ඔහු කී දේ නෑසුණා සේ අම්මා දෙස බැලුවා ය. අම්මා සිටියේ තීරණයක් ගත නොහැකිව දෙගිඩියාවක ය. අමන්දි අම්මා වාඩි වී සිටි දිග සෝපාවේ අම්මා අසළින් ම වාඩි වූවා ය. කුඩා කළ කළා සේ අම්මා ගේ උරහිස මත සිය හිස හොවා ගත්තා ය. ඒ උණුසුම සැමදිනක ම මෙන් අදත් සුවදායක ය. අම්මා ඇගේ උරහිස වටින් අත යවා හිස අත ගෑවා ය.

"මේ වගේ ලෙඩ පාරම්පරික වෛද්‍ය ක්‍රම වලින් හොඳ කරන්න පුලුවන්ද බැයිද කියන්න මං දන්නෙ නෑ.. සමහරවිට පුලුවන් වෙන්නත් පුලුවන්.. ඒත් ඒ වගේ අවදානමක් ගන්නෙ ඇයි..?" කිසිවකු කිසිදු අදහසක් ප්‍රකාශ නොකළ බැවින් මිලින්ද ම යළි කතා කළේ ය.

"බටහිර වෛද්‍ය ක්‍රමයෙන් මේක හොඳකරන්න පුලුවන් කියල සහතිකයකුත් නැහැ නේද පුතේ..?" තාත්තා ඇසුවේ බො-හෝ වේලාවක් කල්පනා කරමින් සිටීමෙන් පසුව ය. එය එක එල්ලේ පිලිතුරු දිය හැකි පැනයක් නොවන බව මිලින්ද දනියි. එසේ වුව ද වෛද්‍යවරයකු ලෙස අමන්දි ගන්නට යන මේ අවදානම් සහිත පියවරට එකඟවන්නට තමාට නොහැකි යයි ඔහු සිතුවේ ය.

"මං දැනුවත්ව හොඳ වුණ අය ගොඩක් ඉන්නවා.." ඔහු කීවේ ය. ".. බටහිර වෛද්‍ය ක්‍රමය විද්‍යාත්මකයි.. හැම ප්‍රතිකාරයක්ම පර්යේෂණ වලින් තහවුරු කරලා තියෙනවා.."

"හොඳ නොවුණ අය වැඩියි නේද..?"

මෙය තේරුමක් නැති වාදයක් යයි අමන්දිට සිතෙයි. තීරණය ගෙන අවසන් ය. මේ කිසිදු කතාවකින් තමා ගත් තීරණය වෙනස් නොවනු ඇති බව ඇය දනියි.

"මං දන්නවා ඔයාල මා ගැන හුඟක් වොරි වෙනවා කියලා... .. බට් දෙයාස් නෝ නීඩ් ටු ආගිව් මිලින්ද.. අයි හැව් ඩිසයිඩඩ් වට් ටු ඩූ.." අමන්දි කීවේ එනිසා ය. "මම සුමන හාමුදුරුවන්ගෙ ප්‍රතිකාර ක්‍රමයට එකඟයි.. මට ඒ ගැන විශ්වාසයක් තියෙනවා.. මං තීරණය අරගෙන ඉවරයිනෙ.. මට ඕනෙ වුණේ ඒක ඔයාලට කියන්න විතරයි.."

මිලින්ද චතුරි දෙස හෙලුවේ තමා මෙය අනුමත නොකරන්නේය යන්න හැඟවෙන බැල්මකි.

"අපට නොදැනෙන නොවැටහෙන හැම